## (6). දකුණු පළාත් සභාවේ 1990 අංක 02 දරන පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය.

1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ IV සහ V වන උපලේඛනවල විස්තර වන ප්‍රාදේශීය සභා සඳහා විශේෂ කොමසාරිස්වරු පත් කිරීම පිණිස හා එයට සම්බන්ධ වූ හෝ/හා අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියයි.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

**01**.(1) මෙම ප්‍රඥප්තිය 1990 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලැබේ.

(2) මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

විශේෂ කොමසාරිස්වරයෙකු පත් කිරීම

**02**. (I) වෙනත් ලිඛිත නීතියක මෙයට පටහැනිව කෙසේ සඳහන්ව තිබුණද අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ IV සහ V උපලේඛනවල දක්වා ඇති ප්‍රාදේශීය සභාවලින් මෙම පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය සඳහා විශේෂ කොමසාරිස්වරයෙකු පත් කරනු ලැබිය හැකිය.

(II) ඉහත (1) උප වගන්තියේ දක්වා ඇති විශේෂ කොමසාරිස්වරයාගේ පත්වීම එකී නියෝගයෙහි විශේෂයෙන් සඳහන් කර ඇත්නම් මිස 1990 ජනවාරි 01 වන දිනෙන් පටන්ගෙන කලින් කලට කරන ලද සංශෝධන ඇතුළත් (262වන අධිකාරිය වන) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධි විධාන ප්‍රකාර (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභාවට සභිකයන් තෝරා පත් කර ගනු ලබන තුරු බල පැවැත්විය යුතුය.

(III) මෙම වගන්තියේ (1) උප වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභාවක විශේෂ කොමසාරිස්වරයා මිය යෑම, ඉල්ලා අස්වීම, තනතුරෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් ඉවත් වීමෙන් පුරප්පාඩු වූ විට එකී විශේෂ කොමසාරිස්වරයාගේ තව දුරටත් ඉතිරි වී ඇති ධූර කාලය වෙනුවෙන් වෙනත් විශේෂ කොමසාරිස්වරයෙකු අමාත්‍යවරයා විසින් එකී ප්‍රාදේශීය සභාවට පත් කරනු ලැබිය හැකිය.



**03**. මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන වෙනත් නීතියක් සමග අනනුකූල වන්නේ නම් හෝ ගැටෙන්නේ නම් හෝ මෙම ප්‍රඥප්තියේ සඳහන් විධි විධාන එම නීතිය අභිබවා බල පැවැත්විය යුතුය.

**04**. ප්‍රාදේශීය සභාව යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභාවක් අදහස් වෙයි.

1990 මාර්තු මස 13 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

පී. ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති,
දකුණු පළාත් සභාව

1990 අප්‍රේල් මස 06 වන දින
ගාල්ලේ "හිල්ටොප්" මන්දිරයේ පිහිටි
දකුණු පළාත් සභා කාර්යාලයේදීය.

දකුණු පළාත් සභාවේ 1990 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 එච් වගන්තිය ප්‍රකාර, අද දින මවිසින් මෙයින් අනුමත කරන ලද බව දන්වමි.
1990.04.17 දින,
ගාල්ලේදීය.

එම්. ඒ. බාකීර් මාකර්
ආණ්ඩුකාර
දකුණු පළාත